# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2363/39 - 2023 දෙසැම්බර් මස 20 වැනි බදාදා - 2023.12.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 34, 1976 අංක 18, 1977 අංක 9, 1980 අංක 56 සහ 1988 අංක 80 දරන නිවාස දේපළ උපරිමය පිළිබඳ සංශෝධන නීතිවලින් හා 1988 අංක 4 දරන නිවාස දේපළ උපරිමය පිළිබඳ (විශේෂ විධිවිධාන) පනත මගින් සංශෝධිත 1973 අංක 1 දරන නිවාස දේපළ උපරිමය පිළිබඳ නීතිය**

17 අ (1) වගන්තිය යටතේ නියෝගය

ඉහත කී පරිදි සංශෝධනය කරන ලද 1973 අංක 1 දරන නිවාස දේපළ උපරිමය පිළිබඳ නීතියේ 17 අ (1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජාතික නිවාස කොමසාරිස් ගාමිණී පෙරේරා වන මම, ගරු නාගරික සංවර්ධන හා නිවාස ඇමතිතුමාගේ ලිඛිත අනුමැතිය ඇතිව මේ සමග ඇති උපලේඛනයේ සවිස්තරාත්මකව දක්වා ඇති බිම් කොටසේ අයිතිය මින් අවසතු කරන අතර, එම බිම් කොටස කිසි කලෙකත් මා වෙත පැවරී නොතිබුණු බවට සළකන බවද තවදුරටත් ප්‍රකාශ කරමි.

ජ්‍යෝෂ්ඨ නීතිඥ ගාමිණී පෙරේරා,
ජාතික නිවාස කොමසාරිස්.

2023 දෙසැම්බර් මස 15 වැනි දින,
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
2 මහල, සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

1A - G 41068— 07 (2023/12)
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සීමාව ඇතුළත මට්ටක්කුලිය අංක 1 දරන කොට්ඨාසය ඇතුළත මට්ටක්කුලිය විස්වයික් පාරේ පිහිටි වරිපනම් අංක 106, 108, 110, 112, 106/8 සිට 106/10 දක්වා වූ දේපළ වලට බලයලත් මිනින්දෝරු ඒ. ආර්. ඩයස් අබේගුණවර්ධන මහතා විසින් 1994.12.16 දින මැන සාදන ලද අංක 3990- දරන පිඹුරේ අංක 7B දරන කැබැල්ලට මායිම්,

*උතුරට* : විස්වයික් පාරේ වරිපනම් අංක 116 දරන දේපළ ද,
*නැගෙනහිරට* : ශාන්ත මේරි පාරේ වරිපනම් අංක 32 දරන දේපළ ද,
*දකුණට* : ශාන්ත මේරි පාරේ වරිපනම් අංක 98 දරන දේපළ ද,
*බටහිරට* : අංක 3990 දරන පිඹුරේ අංක 7A දරන කැබැල්ල ද.

යන මායිම් තුළ පිහිටි අක්කර බිංදුවයි රූඩ් බිංදුවයි පර්චස් පහලොවයි දශම හයයි නවයක් (අ. 0, රූ. 0, පර්.15.69) හෙවත් හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි තුනයි නවයයි හයයි නවයක් (0.03969) විශාල වූ ඉඩම හා ඊට අයත් ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ඇතුළු සියළු දෙය ද වේ.

ඉහත සඳහන් කළ ඉඩම පහත සඳහන් ඉඩමෙන් බෙදා වෙන් කරන ලද දේපළකි.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සීමාව ඇතුළත මට්ටක්කුලිය අංක 1 දරන කොට්ඨාසය ඇතුළත මට්ටක්කුලිය විස්වයික් පාරේ පිහිටි වරිපනම් අංක 106, 108, 110, 112, 106/8 සිට 106/10 දක්වා වූ දේපළ වලට බලයලත් මිනින්දෝරු එල්. එස්. බී. ප්‍රනාන්දු මහතා විසින් මැන සාදන ලද 1976.10.20 දිනැති අංක 453 දරන පිඹුරේ අංක 7 දරන කැබැල්ලට මායිම්,

*උතුරට* : විස්වයික් පාරේ වරිපනම් අංක 116 දරන දේපළ ද, කැබලි අංක 1, 4, 5 සහ 6 දරන කොටස් ද,
*නැගෙනහිරට* : ශාන්ත මේරි පාරේ වරිපනම් අංක 32, මට්ටක්කුලිය මැද පාරේ වරිපනම් අංක 75 දරන දේපළ ද, කැබලි අංක 5 සහ 6 දරන කොටස් ද,
*දකුණට* : විස්වයික් පාරේ වරිපනම් අංක 98 දරන දේපළ ද, කැබලි අංක 1, 2, 4, 5 සහ 6 දරන කොටස් ද,
*බටහිරට* : විස්වයික් පාර ද කැබලි අංක 1 සිට 6 දක්වා කොටස් ද,

යන මායිම් තුළ පිහිටි අක්කර බිංදුවයි රූඩ් බිංදුවයි පර්චස් තිස්හයයි දශම තුනයි නවයක් (අ. 0, රූ. 0, පර්. 36.39) හෙවත් හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි නවයයි දෙකයි බිංදුවයි හයක් (0.09206) විශාල වූ ඉඩම හා ඊට අයත් ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ඇතුළු සියළු දෙය ද වේ.

EOG 12 - 0299

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.